**රජ්ගම ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
**-----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**---------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**--------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 19 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 29 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**--------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට රජ්ගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාළ ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.72,293 ක් හා ඉකුත් වර්ෂයට අදාළ, ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.20,830 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වෙළඳ බලපත්‍ර ණයගැතියෝ රු.27,208 ක් වැඩියෙන් හා උසාවි දඩ ණයගැතියෝ රු.51,000 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාළ මූලධන ආධාර රු.495,540 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ දෙන ලද අත්තිකාරම් වලින් පියවා තිබුණු රු.351,842 ක් වියදම් ලෙස ගිණුම් ගතකර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.13,677,180 ක දායක මුදල ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) වැටුප් රහිත නිවාඩු වෙනුවෙන් අයකර ගතයුතු රු.39,550 ක් ගිණුම් ගතකර නොතිබුණි.

#### 1.3.2 නොසැසඳුණු ගිණුම්
**---------------------**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.100,241,952 ක් වූ ගිණුම් විෂයයන් 06 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර අසමානතා වල එකතුව රු.1,808,553 ක් විය.

**1.3.3 අවිනිශ්චිත ගිණුම**

**--------------------**

අවිනිශ්චිත ගිණුමේ රු.288,833 ක් වූ හර ශේෂය සමාලෝචිත වර්ෂයේදීත් නිරවුල් කර නොතිබුණි.

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**-------------------------------------**

**(අ) ලැබිය යුතු ගිණුම්**

**--------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) දීර්ඝ කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් පවතින එකතුව රු.10,053,912 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 05 ක් හඳුනාගෙන ගිණුම් නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේ දී කටයුතු කර නොතිබුණි.

(ii) 2014 වර්ෂයේ කර්මාන්තයකට අදාළ ණයගැතියෝ රු.1,878,640 ක් නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

--------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2001 වර්ෂයේ සිට නොවෙනස්ව ඉදිරියට ගෙන එමින් පවතින, කලින් ලද ආදායම් හා නිලධාරීන් වෙත ගෙවිය යුතු මුදල් වල එකතුව රු.571,597 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක වටිනාකම හඳුනාගෙන නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ත් පියවර ගෙන නොතිබුණි.

(ii) 2015 වර්ෂයේ සිට නොවෙනස්ව ඉදිරියට ගෙන එමින් පවතින රු.553,504 ක වෙනත් ණයහිමි ශේෂය සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් කර නොතිබුණි.

(iii) රු.5,507,420 ක් වූ කර්මාන්ත ණයහිමි ශේෂය තුළ පැවති වර්ෂ 04 ක් ඉක්ම වූ එකතුව රු.2,492,788 ක් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

**1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම**

**----------------------------------------------------**

**තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

---------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.33,211,172 ක් වූ ගිණුම් විෂයයන් 12 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ආ) භෞතිකව හෝ ලේඛනගතව නොපැවති රු.234,633 ක් වූ ජල කර්මාන්ත තොගයක් හා රු.73,764 ක් වූ වානේ කැබිනෙට්ටු ගිණුමේ ශේෂයන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**1.3.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| **(අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති** | |
| (i) රීති 33 | වරිපනම් බදු ගෙවීම් පැහැර හැර ඇති පුද්ගලයින් පිළිබඳ ලැයිස්තු සහ දේපල තහනම් කිරීමේ වරෙන්තු ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. |
| (ii) රීති 59 | සභා බලප්‍රදේශය තුළ සමීක්ෂණයන් පවත්වා කර්මාන්ත පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| මුදල් රෙගුලාසි 1645, 1646 | සභාව සතු වාහනවලට අදාළ දෛනික ධාවන සටහන් හා මාසික කාර්යසාධන සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත | ආදේශක සේවකයින් 06 දෙනෙකු සඳහා 2002 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා සේවා නියුක්තියන්ගේ භාර අරමුදලට ගෙවිය යුතු සියයට 03 ක දායක මුදල් නොගෙවීම මත රු.25,222 ක අධිභාර මුදලක් සභා අරමුදලින් ගෙවා තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.18,611,431 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.22,308,224 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,372,294 | 1,235,812 | 1,601,703 | 15,302,885 | 1,500,000 | 1,434,164 | 881,743 | 10,741,108 |
| (ii) | කුලී | 105,600 | 105,600 | 110,590 | 669,054 | 1,000,000 | 105,600 | 108,090 | 674,044 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 568,183 | 675,587 | 675,587 | 81,622 | 800,000 | 34,621,090 | 521,399 | 81,622 |
| | | 2,046,077 | 2,016,999 | 2,387,880 | 16,053,561 | 3,300,000 | 36,160,854 | 1,511,232 | 11,496,774 |

#### 2.2.2 වරිපනම් හා බදු

**(අ) වරිපනම්**

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයට අදාළව අයකරගත යුතු වූ රු.11,976,920 ක් වූ වරිපනම් බදුවලින් වර්ෂය තුළ අයකිරීම සියයට 13 ක් පමණක් වීම නිසා වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු ශේෂය රු.15,302,885 ක් විය. එම ශේෂය ආරම්භක ශේෂයට සාපේක්ෂව රු.4,561,777 කින් වැඩි වී තිබුණු අතර, රු.2,424,589 ක් වූ හිඟ මුදල් අය කිරීමට 2017 වසරේ දී දේපල තහනම් කිරීමේ නිලධාරීන් දෙදෙනෙකුට භාර දී තිබූ නමුත්, හිඟ මුදලින් 17% ක ප්‍රමාණයක් පමණක් අයකර තිබුණි.

(ii) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාරව හිඟ වරිපනම් අයකර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කිරීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(ආ) **ව්‍යාපාර බදු**

-------------

සමාලෝචිත වර්ෂයේ ආරම්භයට පැවති රු.179,800 ක හිඟ ව්‍යාපාර බදු සහ රු.151,130 ක වර්ෂයේ බිල් කිරීම්වලින් සියයට 40 ක් පමණක් වර්ෂය තුළ අය කරගෙන තිබුණු අතර, වර්ෂය අවසානයට වූ හිඟය රු.197,410 ක් දක්වා වර්ධනය වී තිබුණි. හිඟ ව්‍යාපාර බදු අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(4) වගන්තිය ප්‍රකාරව විධිමත් වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි.

**2.2.3 බදු කුලී**

--------

සමාලෝචිත වර්ෂයේ ආරම්භයට පැවැති රු.674,044 ක හිඟයෙන් සහ රු.105,600 ක වර්ෂයේ බිල් කිරීම් වලින් සියයට 14 ක් පමණක් වර්ෂය තුළ අය කරගෙන තිබුණු අතර, වර්ෂය අවසානයට රු.669,054 ක හිඟ කඩ කුලී ශේෂයක් පැවැතුණි. හිඟ මුදල් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දී කටයුතු කර නොතිබුණි.

**2.2.4 බලපත්‍ර ගාස්තු**

---------------

සමාලෝචිත වර්ෂයේ ආරම්භයට පැවති රු.81,622 ක හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තු ශේෂයෙන් සහ රු.675,587 ක වර්ෂයේ බිල් කිරීම්වලින් සියයට 89 ක් පමණක් වර්ෂය තුළ අය කරගෙන තිබුණ ද, වර්ෂයේ ආරම්භක හිඟ ශේෂය වූ රු.81,622 ක් අය වී නොතිබුණි. සභාව විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(4) වගන්තිය ප්‍රකාරව බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වශයෙන් රු.12,918,424 ක් හා මුද්දර ගාස්තු වශයෙන් රු.40,464,699 ක් අයවිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1 කාර්යයසාධනය**

------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත්, 2017 දෙසැම්බර් 31 දින වනවිට අතුරු ව්‍යවස්ථා පනවාගෙන නොතිබුණි.

(ආ) **ක්‍රියාකාරී සැලැස්ම**

--------------------

ප්‍රාදේශීය සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) **අත්හැර දැමූ කර්තව්‍යයන්**

----------------------------

ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් 2016 සැප්තැම්බර් 08 දින ලැබී තිබුණ රු.1,000,000 කින් ව්‍යාපෘති යෝජනා 13 ක් නිම කිරීමට අනුමත කර තිබුණි. අනුමත ව්‍යාපෘති කිසිවක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර, රු.146,200 ක් වැයකර, සභාවේ වාහන අළුත්වැඩියාව සිදුකර ඉතිරි රු.853,800 ක් ඵලදායී ව්‍යාපෘතියකට නොයොදවා 2017 අගෝස්තු මස අදාළ අමාත්‍යාංශය වෙත ආපසු යවා තිබුණි.

(ඉ) **ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

--------------------------------

ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව පරීක්ෂාවේ දී පහත තොරතුරු අනාවරණය විය.

(i) සභාවෙන් වෙන්කර ලබාගන්නා කසළ මොන්රෝවියා වත්තට රැගෙන ගොස් භාරදීම සිදු කරමින් පැවති නමුත්, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ කසළ කළමනාකරණ කටයුතු විධිමත් කිරීමට අදාළ PL/1/5/12 අංක දරන මාර්ගෝපදේශය ප්‍රකාර කටයුතු කිරීමට දීර්ඝකාලීන විධිමත් සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ii) කොම්පෝස්ට් නිෂ්පාදනයට භාවිතා කළ රු.599,000 ක් වටිනා යන්ත්‍රෝපකරණ නිෂ්ක්‍රීයව පැවතුණි.

(iii) පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් සභා බල ප්‍රදේශයේ බෙදා දීමට ලබාදුන් කසළ බඳුන් 930 ක් බෙදා දීමට කටයුතු නොකර සභාවේ නිෂ්ක්‍රීයව පැවැතුණි.

(ඊ) **තිරසර සංවර්ධන ඉලක්ක**

----------------------------

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මාසයකට ලක්ෂ දෙකක පමණ ආදායමක් උපදවනු ලැබූ ගලි බවුසරය 2014 වර්ෂයේ සිට අක්‍රීයව පැවතුණි. 2014 සැප්තැම්බර් මස දකුණු පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තු යාන්ත්‍රික ඉංජිනේරු විසින් බවුසරය අළුත්වැඩියා කිරීමට කටයුතු කරන ලෙස දන්වා තිබුණ ද, 2018 අප්‍රේල් වනවිටත් ඒ පිළිබඳව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) 2014 වර්ෂයේ සංවර්ධන සැලැස්ම යටතේ අවිච්ඡේද වූ කර්මාන්තයකට අදාළ බිල්පත් 2016 සැප්තැම්බර් 30 දිනට පෙර සහකාර අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන) වෙත ඉදිරිපත් කිරීමට සභාව කටයුතු නොකිරීම නිසා, බිල්පතට ගෙවීම ප්‍රතික්ෂේප වී තිබුණු අතර, බිල්පත් වටිනාකම වූ රු.268,849 ක් සභා අරමුදලින් ගෙවීමට සිදු වී තිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

----------------------------------

**(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත**

---------------------------------

සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත කාර්යය මණ්ඩලය ඉක්මවා 10 දෙනෙකු සේවයේ යොදවා තිබූ අතර, අනුමත තනතුරුවල පුරප්පාඩු 04 ක් පැවතුණි. පුරප්පාඩු පුරවා ගැනීමට හා අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) සේවක ණය**

**--------------**

සභාවේ සේවය කළ සේවකයින් 11 දෙනෙකුගෙන් අයවිය යුතු රු.335,387 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.4 ආර්ථික නොවූ ගනුදෙනු**

**--------------------------**

2002 වර්ෂයේ දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබාගත් රු.1,748,007 ක ණයමුදල යොදාගෙන සභා බල ප්‍රදේශයේ අඩු ආදායම් ලාභීන් සඳහා පොදු වෙළඳපොල අසළ වැසිකිළි පද්ධති 02 ක් ඉදිකර තිබුණි. වර්ෂ 04 කට පසු එම ස්ථානයෙහි පිළිරුවක් ඉදිකිරීමට වැසිකිළි පද්ධතිය කඩා ඉවත් කර තිබූ අතර, ඒ සඳහා සභා අනුමැතියක් ද ලබාගෙන නොතිබුණි. ණය මුදල සඳහා මාසිකව රු.15,497 ක් බැගින් 2021 මාර්තු 30 දින දක්වා ණය වාරික ගෙවිය යුතුව තිබුණ අතර, මෙම ණය මුදලින් කිසිදු ප්‍රතිලාභයක් බල ප්‍රදේශයේ ජනතාවට ලැබී නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

--------------------------------------

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**-------------------------------**

සමාලෝචිත වර්ෂය සඳහා සංශෝධිත මූල්‍ය ප්‍රකාශනය 2018 අප්‍රේල් 05 දින ඉදිරිපත් කර තිබුණි.

**4.2 අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත විස්තර දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.

(අ) පුනරාවර්තන වියදම් විෂයයන් 06 ක එකතුව රු.9,465,063 ක් වූ ඉතිරිවීම් දක්නට ලැබුණු අතර, එම වටිනාකම සියයට 03 සිට සියයට 85 අතර පරාසයක පැවැතුණි.

(ආ) වියදම් විෂයයන් දෙකක අනුමත සීමාව ඉක්මවා රු.220,431 ක වියදම් දරා තිබූ අතර, එම වටිනාකම සියයට 31 ක් හා සියයට 33 ක් විය.

(ඇ) ආදායම් විෂයයක අහිතකර විචලනය රු.378,708 ක් වූ අතර, එම වටිනාකම සියයට 20 ක් විය.

**4.3 අභ්‍යන්තර විගණනය**

-----------------------

සභාව සඳහා අභ්‍යන්තර විගණන නිලධාරියෙක් පත්කර තිබුණ ද, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

--------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | (i) | ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව පවත්වා නොතිබීම. |
| | | (ii) | ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ වාර්ෂික සමීක්ෂණ පවත්වා නොතිබීම. |
| (ආ) | ආදායම් රැස්කිරීම | (i) | හිඟ ආදායම් අයකර ගැනීම විධිමත් නොවීම |
| | | (ii) | හිඟ ආදායම් කාලවිශ්ලේෂණයක් පිළියෙල කර නොතිබීම. |
| | | (iii) | දියුණු ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් අයකර නොතිබීම. |
| (ඇ) | ගිණුම්කරණය හා ලේඛන පැවැත්වීම | (i) | ඉකුත් වර්ෂවල සිට නොවෙනස්ව ඉදිරියට ගෙනෙමින් පවතින ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබීම. |
| | | (ii) | මූල්‍ය ප්‍රකාශනවල සහ ඊට අදාළ උපලේඛන වල දැක්වෙන ශේෂ අතර, වෙනස්කම් පැවතීම. |
| | | (iii) | දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබාගත් ණය වාරික ගෙවීම පිළිබඳ ලේඛනයක් නඩත්තු නොකිරීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සේවක මණ්ඩල කළමනාකරණය | (i) | සභාවේ අතිරික්ත කාර්යමණ්ඩලය විධිමත් කර නොගැනීම. |
| | | (ii) | විශ්‍රාම ගිය හා මිය ගිය නිලධාරීන්ගේ හිඟ ණය ශේෂ අයකර නොගැනීම. |
| (ඉ) | මූල්‍ය කළමනාකරණය | | යාවත්කාලීනව බැංකු සැසඳුම් පිළියෙල කර නොතිබීම. |
| (ඊ) | අයවැය පාලනය | | වියදම් සහ ආදායම් පිළිබඳව පසු විපරම් කර, අයවැය සංශෝධනය කර ගැනීමට කටයුතු කර නොතිබීම. |